WWW.OLEVELAPI.COM



සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

**11 S I, II**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2018 දෙසැම්බර්
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2018 டிசெம்பர்
**General Certificate of Education (Ord. Level) Examination, December 2018**

බුද්ධ ධර්මය **I, II**
பௌத்தம் **I, II**
Buddhism **I, II**

## බුද්ධ ධර්මය II

* **පළමුවැනි** ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න **හතරක්** ඇතුළු ව, ප්‍රශ්න **පහකට** පමණක් පිළිතුරු සපයන්න.

* පළමුවැනි ප්‍රශ්නයට ලකුණු **20** ක් ද තෝරා ගන්නා අනෙක් ප්‍රශ්නයකට ලකුණු **10** බැගින් ද හිමි වේ.

---

**1.** (i) සිදුහත් බෝසතාණන් වහන්සේ බුද්ධත්වයට පත්වීමෙන් පසුව කළ ප්‍රථම උදන වාක්‍යයට අයත් ගාථාවේ මුල් පද දෙක ලියන්න.

(ii) සුද්ධෝදන රජතුමා විසින් සිදුහත් කුමාරයාට වාසය කිරීමට ඉදිකර දුන් මාලිගා **තුන** නම් කරන්න.

(iii) සතර පෙර නිමිති ලියා දක්වන්න.

(iv) "ලාභෝ අලාභෝ අයසෝ යසෝ ච" යන ගාථාවෙන් කියවෙන ධර්ම කරුණු හඳුන්වන පොදු නාමය ලියන්න.

(v) වණ්ණුපථ ජාතකයෙන් ප්‍රකට වන්නේ සිදුහත් බෝසතාණන් සම්පූර්ණ කළ කිනම් පාරමිතාව ද?

(vi) "ඒහි පස්සිකෝ" යන දහම් ගුණයෙහි අර්ථය ලියන්න.

(vii) පරාභව සූත්‍රයේ දැක්වෙන පුද්ගලයාගේ පිරිහීමට හේතු වන කරුණු **දෙකක්** ලියන්න.

(viii) බුදුදහමේ උගන්වන 'අත්ථි සුඛය' යන්න කෙටියෙන් පහදන්න.

(ix) සේඛියා ධර්මවලට අනුව ආහාර පරිභෝජනයේදී පිළිපැදිය යුතු යහපත් පුරුදු **දෙකක්** ලියන්න.

(x) "ඇත ධූලින් වැසී ගිය ඇත්රජ යැ. මෑත සවණක් සණ බුදුරැසින් සැදී ගිය බුදුරජාණෝ යැ..." යන පාඨය ඇතුළත් ධර්ම ග්‍රන්ථය හා එහි කතුවරයා නම් කරන්න.

**2.** (i) බුදුරජාණන් වහන්සේ ස්වාභාවික පරිසරය ආශ්‍රිතව වස් විසූ ස්ථාන **දෙකක්** නම් කරන්න.

(ii) උන්වහන්සේ පරිසරයේ සුන්දරත්වය අගය කළ ආකාරය කෙටියෙන් දක්වන්න.

(iii) පාරිසරික සම්පත් ආරක්ෂා කිරීමෙන් ලැබිය හැකි ප්‍රයෝජන මොනවාදැයි පැහැදිලි කරන්න.

**3.** (i) "තංච කම්මං කතං සාධු" යන ධම්මපද ගාථාව සම්පූර්ණ කර ලියන්න.

(ii) එම ගාථාවේ තේරුම ලියන්න.

(iii) පුද්ගල ජීවිතයේ සාර්ථකත්වයට උපදෙස් සපයන ග්‍රන්ථයක් ලෙස ධම්මපදය ඇගයීමට ලක් කරන්න.

**4.** (i) දස රාජධර්මවලට අයත් කරුණු අතුරෙන් **දෙකක්** ලියන්න.

(ii) ඉහත (i) හි දැක්වූ කරුණුවලින් එක් කරුණක් පැහැදිලි කරන්න.

(iii) "මහජනතාවට යහපත් සේවාවක් සැපයීමට දස රාජධර්ම ඉවහල් වේ." විස්තර කරන්න.

**5.** (i) මහින්දාගමනය සිදු වූ ආකාරය සැකෙවින් දක්වන්න.

(ii) ලක්දිව බුදුසමයේ ව්‍යාප්තියට දෙවනපෑතිස් රජතුමාගෙන් සිදු වූ මෙහෙය අගය කරන්න.

(iii) මහින්දාගමනයෙන් අප ලැබූ දායාද පිළිබඳ විස්තරයක් කරන්න.

[හයවැනි පිටුව බලන්න

අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ....

**6.** (i) දෙවන ධර්ම සංගායනාව පැවැත්වීමට තුඩුදුන් හේතු සැකෙවින් දක්වන්න.

(ii) එම ධර්ම සංගායනාව පැවැත් වූ ස්ථානය, රාජානුග්‍රහය ලබා දුන් පාලකයා හා සහභාගි වූ භික්ෂූන් ගණන ලියන්න.

(iii) දෙවන ධර්ම සංගායනාවේ ප්‍රතිඵල ගෙනහැර දක්වන්න.

**7.** පහත සඳහන් මාතෘකා අතුරෙන් **දෙකකට** කෙටි සටහන් ලියන්න.

(i) රේරුකානේ චන්දවිමල මහනාහිමි

(ii) කල්‍යාණ මිත්තතා

(iii) සද්ධර්ම රත්නාවලිය

(iv) බුදුපිළිමය

* * *

WWW.OLEVELAPI.COM

අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ....